අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය - 2020
General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2020

භූගෝල විද්‍යාව I
Geography I

22 | S | I

කාලය : පැය තුනයි
Time : Three hours

විභාග අංකය : ....

උපදෙස් :

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විතවේ. I **කොටස** බහුවරණ **ප්‍රශ්න 40** කින් සමන්විත වන අතර, ඒවාට පිළිතුරු **මෙම පත්‍රයේම** සැපයිය යුතුය.
- I කොටසේ නිවැරදි පිළිතුරක් සඳහා **ලකුණු එක** බැගින් හිමිවේ.
- II කොටසෙහි ප්‍රශ්න **දෙකටම** පිළිතුරු සැපයිය යුතුය.
- III කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතුය.
- I, II **සහ** III කොටස්වල පිළිතුරු පත්‍ර **එකට අමුණා** භාර දිය යුතු ය.

I කොටස

- ප්‍රශ්නවලට නිවරදි පිළිතුර අඩංගු වරණය තෝරා, එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ ඇති **තිත් ඉර මත** ලියන්න.

01). මෙට්‍රික් සිතියම් සූචකයට අනුව ශ්‍රී ලංකා භූමිය ආවරණය කෙරෙන 1:50000 සිතියම් ගණන කොපමණ ද?

(1) 72 (2) 82 (3) 92 (4) 102 (5) 62 (...............)

02). භූ ලක්ෂණ සිතියමක දැක්වෙන භෞතික ලක්ෂණයක් හා සංස්කෘතික ලක්ෂණයක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) ජනාවාස හා ඓතිහාසික ස්ථාන
(2) ගංගාව හා පාෂාණ උද්ගතය
(3) භූමි පරිහරණය හා ගෙවතු
(4) වාරිමාර්ග හා ජනාවාස
(5) අවතල බෑවුම් හා මහා මාර්ග (...............)

03) දී ඇති සංඛ්‍යා රාශියක ඉහළම අගය හා පහළම අගය අතර වෙනස වනුයේ,

(1) මධ්‍යනයයි. (2) අපකිරණයයි. (3) මධ්‍යස්ථයයි.
(4) මාතයයි. (5) පරාසයයි. (...............)

04) $\bar{X} = \frac{\sum fx}{\Sigma f}$ යන සූත්‍රය භාවිතා කරනුයේ,

(1) සම්මත අපගමනය ගණනය කිරීම සඳහාය.
(2) මධ්‍යනය අපගමනය සෙවීම සඳහාය.
(3) මධ්‍යනය සෙවීම සඳහාය.
(4) මධ්‍යස්ථය සෙවීම සඳහාය.
(5) මාතය සෙවීම සඳහාය. (...............)

05) කිසියම් විචල්‍ය කීපයක් රේඛා කීපයක් මගින් නිරූපණය කරනු ලබන ප්‍රස්තාර ක්‍රමය හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

(1) බහු රේඛා ප්‍රස්තාර නමිනි. (2) පිරමීඩාකාර ප්‍රස්තාර නමිනි.
(3) සරල තීරු ප්‍රස්තාර නමිනි. (4) බහු තීරු ප්‍රස්තාර නමිනි.
(5) සරල රේඛා ප්‍රස්තාර නමිනි. (...............)

06) GPS (භූගෝලීය ස්ථාන ගත කිරීමේ පද්ධතිය) චන්ද්‍රිකා තොරතුරු ලබා ගැනීම හා මෙහෙය වන ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානය පිහිටියේ,

(1) දකුණු ඇමරිකාවේ බ්‍රසීලයේය. (2) අත්ලන්තික් සාගරයේ හයිටි දූපත් වලය.
(3) චීනයේ බෙයිජිං වලය. (4) ජපානයේ ටෝකියෝ වලය.
(5) ඇමරිකා එක්සත් ජනපදයේ කොලරාඩෝ වලය. (...............)

07) රටක ජන සංඛ්‍යාවේ පුමිතිරි අනුපාතය හා වයස් ව්‍යුහය නිරූපණයට සුදුසුම ප්‍රස්තාර ක්‍රමය කුමක් ද?

(1) බහු තීරු ප්‍රස්තාරයයි. (2) ප්‍රතිශතක තීරු ප්‍රස්තාරයයි.
(3) තීරු හා රේඛා ප්‍රස්තාරයයි. (4) පිරමීඩාකාර ප්‍රස්තාරයයි.
(5) සක් තීරු පිරමීඩාකාර ප්‍රස්තාරයයි. (...............)

08) අන්තර් චාතුර්තක පරාසයෙන් නියෝජනය වන්නේ මුළු දත්ත ප්‍රමාණයෙන් කොපමණ ප්‍රතිශතයක් ද?

(1) 25% (2) 50% (3) 60% (4) 75% (5) 100% (...............)

09) සමුච්චිත සංඛ්‍යාතය ප්‍රස්තාරිකව දක්වන විට එය හඳුන්වන්නේ කුමන නමකින් ද?

(1) සංඛ්‍යාත බහුඅස්‍රය (2) රේඛීය ප්‍රස්තාරය
(3) සමුච්චිත ප්‍රතිශත වක්‍රය (ඔගිව්ය) (4) සමුච්චිත සංඛ්‍යාත වක්‍රය
(5) සරල තීරු ප්‍රස්තාරය (...............)

10) ශ්‍රී ලංකාවේ 1:50000 මෙට්‍රික් සිතියමක් මඟින් කොපමණ භූමි ප්‍රමාණයක් ආවරණය වන්නේ ද?

(1) වර්ග කිලෝමීටර් 1000 කි. (2) වර්ග කිලෝමීටර් 2000 කි.
(3) වර්ග කිලෝමීටර් 5000 කි. (4) වර්ග කිලෝමීටර් 10000 කි.
(5) වර්ග කිලෝමීටර් 50000 කි. (...............)

11) පෘථිවියේ සමස්ත ජල ස්කන්ධය ඝන කිලෝමීටර් ප්‍රමාණය කොපමණ ද? (යුනෙස්කෝ ආයතනය ගණනය කර ඇති ආකාරය අනුව)

(1) ඝන කිලෝමීටර් මිලියන 1386 පමණය. (2) ඝන කිලෝමීටර් මිලියන 1836 පමණය.
(3) ඝන කිලෝමීටර් මිලියන 1683 පමණය. (4) ඝන කිලෝමීටර් මිලියන 1122 පමණය.
(5) ඝන කිලෝමීටර් මිලියන 1002 පමණය. (...............)

12) පෘථිවි ව්‍යුහය හා සංයුතිය අනුව ''කොන්රඩ් ආසන්තතිය'' මඟින් වෙන් කරන සීමාව වනුයේ,

(1) කබොල හා ප්‍රාවරණයයි. (2) සියැල් හා සිමැග් ස්තරයයි.
(3) ප්‍රාවරණය හා හරයයි. (4) ඉහළ ප්‍රාවරණය හා පහළ ප්‍රාවරණය.
(5) බාහිර හා අභ්‍යන්තර හරයයි. (...............)

13) චානකොයිට් පාෂාණ පොදුවේ හඳුන්වනු ලබන නාමය වනුයේ,

(1) හිරිගල්ය. (2) හුණුගල්ය. (3) කළුගල්ය.
(4) තිරුවාණගල්ය. (5) බොරළුය. (...............)

14) නැමි කඳු නිර්මාණය වන්නේ,

(1) තැටි කිඳා බැසීමෙනි. (2) තැටි ඇතිල්ලීමෙනි. (3) තැටි චලනය වීමෙනි.
(4) තැටි තෙරපීමෙනි. (5) තැටි මායිම් ගිලා බැසීමෙනි. (...............)

15) ලෝකයේ ක්‍රියාකාරී ගිනිකඳු වලින් 70% ක් පමණ ඇත්තේ,

(1) පැසිෆික් සාගරය අවට කලාපයේය. (2) ඉන්දියන් සාගරය අවට කලාපයේය.
(3) අත්ලාන්තික් සාගරය අවට කලාපයේය. (4) දක්ෂිණ සාගරික කලාපයේය.
(5) ආක්ටික් සාගරය අවට කලාපයේය. (...............)

16) බාර්කන් යනු,

(1) සුළං ආශ්‍රිත ක්‍රියාවලිය හා බැඳි භූ රූපයකි. (2) ග්ලැසියර් ක්‍රියාවලිය හා බැඳි භූ රූපයකි.
(3) කාස්ට් ඛාදනය ක්‍රියාවලිය හා බැඳි භූ රූපයකි. (4) තරංග ක්‍රියාවලිය හා බැඳි භූ රූපයකි.
(5) ගලා යන ජලය ආශ්‍රිත ක්‍රියාවලිය හා බැඳි භූ රූපයකි. (...............)

17) හුණුගල් සහිත පාෂාණ ස්තර බහුල ප්‍රදේශවල දැකිය හැකි ජල වහන රටාව කුමක් ද?

(1) අරීය ජල වහන රටාව (2) වළයාකාර ජල වහන රටාව
(3) සවිරාම ජල වහන රටාව (4) ශාඛීය ජල වහන රටාය
(5) ජලාකාර ජල වහන රටාව (...............)

18) ශ්‍රී ලංකාවට නිරිත දිග මෝසම් සුළං බලපාන කාලවකවානුව කුමක් ද?

(1) දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා කාලය තුළදීය. (2) මාර්තු සිට අප්‍රේල් දක්වා කාලය තුළදීය.
(3) මැයි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළදීය. (4) අප්‍රේල් සිට ඔක්තෝබර් දක්වා කාලය තුළදීය.
(5) නොවැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළදීය (...............)

19) ශ්‍රී ලංකාව දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ පාර්ශවකරුවෙකු වූයේ කුමන වර්ෂයේදී ද?

(1) 1993 (2) 1983 (3) 1893 (4) 1793 (5) 2003 (...............)

20) ''උතුරු දකුණු අර්ධ ගෝල දෙකෙහිම අක්ෂාංශ අංශක $50 - 60$ අතර වූ කලාපයක විහිදේ. ශීත ඍතුවේ හිම පතනය සිදු වුවද ඉක්මනින් දියවී යයි. වර්ෂාපතනය අඩු වුවද ශාක වැඩීමට ප්‍රමාණවත්ය.'' මෙම ලක්ෂණ දැකිය හැකි බියෝම වන්නේ,

(1) මධ්‍යධරණී බියෝම (2) සෞම්‍ය කලාපීය බියෝම (3) තෘණ භූමි හා සැවානා බියෝම
(4) ටයිගා බියෝම (5) නිවර්තන වර්ෂා වනාන්තර බියෝම (...............)

21) බහුවිධ උපද්‍රවයක් වන සුළි සුළං උතුරු පැසිෆික් සාගරයේදී හඳුන්වන්නේ කිනම් නමකින් ද?

(1) හරිකේන් (2) බැගියෝස් (3) ටයිෆූන්
(4) විලිවිලීස් (5) වාසුළි (...............)

22) ආපදා කළමණාකරණයට වැඩි වශයෙන් දායක වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ඉටු නොවන කාර්යයක් වන්නේ කුමක් ද?

(1) සෞඛ්‍ය හා සුභසාධක පහසුකම් ඇති කිරීම. (2) ආරක්ෂක සහන කඳවුරු ඇති කිරීම.
(3) ඉවත් කිරීම හා මුදා ගැනීම. (4) අවතැන්වූවන්ට ආහාර සැපයීම.
(5) ආපදා අවස්ථාව පිළිබඳ පූර්ව දැනුම් දීම. (...............)

23) සූර්යයාගේ සිට පැමිණෙන පාරජම්බුල කිරණ අවශෝෂණය කර ගැනීම සිදු වන්නේ කුමන වායුව මගින් ද?

(1) ඕසෝන් වායුව මගින් (2) CO_2 වායුව මගින් (3) නයිට්‍රජන් වායුව මගින්
(4) මීතේන් වායුව මගින් 65) සල්ෆර් ඩයොක්සයිඩ් වායුව මගින් (...............)

24) වායු පීඩනය මැනීම සඳහා භාවිතා කරන ඒකකය කුමක් ද?

(1) මිලිමීටර්ය. (2) කිලෝමීටර්ය. (3) මිලිබාර්ය.
(4) මිලිලීටර්ය. (5) බැරෝමීටර්ය. (...............)

25) ශ්‍රී ලංකාවට වැඩිම වර්ෂාපතනයක් ලැබෙන ප්‍රදේශය වනුයේ,

(1) නුවරඑළිය (2) මහනුවර (3) වටවල
(4) මාලිබොඩ (5) යටියන්තොට (...............)

26) පෙට්‍රෝලියම් වෙළඳාම පිළිබඳ ඒකාධිකාරයක් පවත්වාගෙන යාම සඳහා පිහිටුවා ගත් සංවිධානය කුමක් ද?

(1) සාර්ක් සංවිධානය (2) ඔපෙක් සංවිධානය (3) යුනිසෙෆ් සංවිධානය
(4) එක්සත් ජාතීන්ගේ සංවිධානය (5) වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව (...............)

27) 1992 අංක 33 දරණ පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ 34 වන වගන්තියට අනුව ඛණිජ කැණීම් හා ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කළ හැක්කේ,

(1) මධ්‍යම පරිසර අධිකාරියටය.
(2) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවටය.
(3) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයටය.
(4) වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවටය.
(5) ඛනිජ තෙල් නීතිගත සංස්ථාවටය. (...............)

28) විදෙස් රටවලට සංක්‍රමණය වූ ලාංකිකයන්ගෙන් වැඩි ප්‍රමාණයක් පදිංචි වී සිටින්නේ,

(1) මැද පෙරදිග රටවලය. (2) වයඹ දිග යුරෝපයේය.
(3) ගිණිකොණදිග ආසියාවේය. (4) ඇමරිකා එක්සත් ජනපදයේය.
(5) ජපානය, සිංගප්පූරුව, කොරියාව (...............)

29) ආසියාවේ රටවල් අතරින් ඉහළ නාගරික මට්ටමක් ගන්නා රටවල් අවරෝහණ පිළිවෙලට දැක්වෙන රටවල් කාණ්ඩය වන්නේ,

(1) සිංගප්පූරුව, ජපානය, කොරියාව (2) ජපානය, කොරියාව, සිංගප්පූරුව
(3) සිංගප්පූරුව, උතුරු කොරියාව, ජපානය (4) කොරියාව, ජපානය, සිංගප්පූරුව
(5) ජපානය, සිංගප්පූරුව, කොරියාව (...............)

30) "Gree Banana" (ග්‍රීන් බනානා) නමින් හැඳින්වෙන නාගරික-කාර්මික වේදිකාව විහිදීමට ආරම්භ වන ප්‍රදේශයවනුයේ,

(1) චිකාගෝය. (2) බොස්ටන්ය. (3) වයඹ දිග එංගලන්තය.
(4) ටෝකියෝය. (5) ග්ලාස්ගෝය. (...............)

31) වයස අවුරුදු 60 ට හා ඊට ඉහළ ජන සංඛ්‍යාව, වයස අවුරුදු 15 ට අඩු ජන සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දැක්වෙන මිනුම වන්නේ,

(1) ජීවන වියදම් දර්ශකය (2) වියපත් දර්ශකය (3) භෞතික ජීවන තත්ත්ව දර්ශකය
(4) ඒක පුද්ගල ආදායම (5) ජන සංඛ්‍යා වර්ධන සීඝ්‍රතාවය (...............)

32) 2012 දී පවත්වන ලද ජන හා නිවාස සංගණනයට අනුව 2012 වසරේදී ශ්‍රී ලංකාවේ වැඩිම සෘණ ශුද්ධ සංක්‍රමණය (-697.7) වාර්ථා වූ දිස්ත්‍රික්කය කුමක් ද?
(1) නුවරඑළිය (2) යාපනය (3) වව්නියාව
(4) මන්නාරම (5) රත්නපුරය (...............)

33) චීනයේ වායු දූෂණය අතින් ඉහළම ස්ථානයේ පසුවන නාගරික ප්‍රදේශ වනුයේ,

(1) සිංජියැන් හා වූහාන් ආශ්‍රිත නාගරික ප්‍රදේශයන්ය.
(2) ෂැංහයි හා සැංසි ආශ්‍රිත නාගරික ප්‍රදේශයන්ය.
(3) බෙයිජිං හා ටියුංජින් ආශ්‍රිත නාගරික ප්‍රදේශයන්ය.
(4) වූහාන් හා සිංජියැන්, මැන්චූරි ආශ්‍රිත නාගරික ප්‍රදේශයන්ය.
(5) බෙයිජිං හා සිංජීනියා ආශ්‍රිත නාගරික ප්‍රදේශයන්ය. (...............)

34) පුල්මුඩේ-ඉල්මනයිට් ඛණිජ සංචිතය පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේ කුමන ප්‍රදේශයේ ද?
(1) ඊශාන දිග වෙරළ ප්‍රදේශයේ (2) නැගෙනහිර වෙරළ ප්‍රදේශයේ
(3) වයඹ දිග වෙරළ ප්‍රදේශයේ (4) නිරිත දිග වෙරළ ප්‍රදේශයේ
(5) දකුණු දිග වෙරළ ප්‍රදේශයේ (...............)

35) කාබන් ප්‍රතිශතය ඉහළ මට්ටමක පවතින ගල් අඟුරු වර්ගය කුමක් ද?
(1) ජීර්ණක ගල් අගුරු (2) ජීර්ණය වෙමින් පවතින ගල් අගුරු
(3) කාෂ්ඨික ගල් අගුරු (4) ප්‍රජතු ගල් අගුරු
(5) ජතු ගල් අගුරු (...............)

36) එක්සත් ජාතීන්ගේ සංචරණ සංවිධානය (UNWT) ස්ථාපිත කර ඇති නගරය කුමක් ද?

(1) ස්පාඤ්ඤයේ මැඩ්රිඩ්ය. (2) ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න්ය.
(3) උතුරු ඇමරිකාවේ කැලිෆෝනියාවේය. (4) ඉන්දියාවේ නවදිල්ලි නුවරය.
(5) පෘතුගාලයේ ලිස්බන්ය. (...............)

37) ''ප්‍රාථමික ආර්ථික කටයුතු වල නියුතු පිරිස් ද නගරයේ ද්විතියික හා තෘතියික ආර්ථික කටයුතු වල නිරත පිරිස් ද මෙම ජනාවාස වල ජීවත් වේ.'' මෙවැනි තත්වයක් දැකිය හැකි වන්නේ,

(1) නාගරික ජනාවාස වලය. (2) ග්‍රාමීය ජනාවාස වලය. (3) ගැමි නාගරික ජනාවාස වලය.
(4) වතු ජනාවාස වලය. (5) ධීවර ජනාවාස වලය. (...............)

38) 1971 භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සොයා ගන්නා ලද ශ්‍රී ලංකාවේ ඇපටයිට් පාෂාණයෙන් සමන්විත වන පොස්පේට් නිධිය පිහිටා ඇති ප්‍රදේශය වනුයේ,

(1) අනුරාධපුර දිස්ත්‍රික්කයේ එප්පාවලය. (2) පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවතය.
(3) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පරන්තන්ය. (4) ගාල්ල දිස්ත්‍රික්කයේ විල්පිටය.
(5) කැගල්ල දිස්ත්‍රික්කයේ සියඹලාපිටියේය. (...............)

39) ශ්‍රී ලංකාවේ සංචරණයේ ප්‍රභේද අතරින් ත්‍රාසජනක අත්දැකීම් ලබා ගැනීම සඳහා වූ සංචරණය හැඳින්වෙන්නේ කිනම් නමකින් ද?

(1) සෞන්දර්ය සංචරණය (2) ප්‍රතිමෝදක සංචරණය (3) වික්‍රමයන් ආශ්‍රිත සංචරණය
(4) සංස්කෘතික සංචරණය (5) පාරිසරික සංචරණය (...............)

40) ''ජන හායන'' දැක්වෙන ජන සංඛ්‍යා පිරමීඩයේ ලක්ෂණ පෙන්නුම් කරන වරණය කුමක් ද?

(1) උපත් අනුපාතිකය පහළ වැටීම, මරණ අනුපාතිකය පහළ වැටීම, ආයු අපේක්ෂාව ඉහළ යාම
(2) උපත් අනුපාතිකය ඉහළ යාම, මරණ අනුපාතිකය ඉහළ යාම, ආයු අපේක්ෂාව පහළ වැටීම
(3) උපත් අනුපාතිකය පහළ වැටීම, මරණ අනුපාතිකය ඉහළ යාම, ආයු අපේක්ෂාව ඉහළ යාම
(4) උපත් අනුපාතිකය ඉහළ යාම, මරණ අනුපාතිකය ඉහළ යාම, ආයු අපේක්ෂාව ඉහළ යාම
(5) උපත් අනුපාතිකය පහළ වැටීම, මරණ අනුපාතිකය පහළ වැටීම, ආයු අපේක්ෂාව පහළ වැටීම
(...............)

II කොටස

01. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50000 පරිමාණයේ මහඹය මෙට්‍රික් සිතියමේ කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ඡ රේඛා අන්තරය මීටර් 20 කි. එම සිතියම පදනම් කරගනිමින් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

සැලකිය යුතුයි :
- ❖ පිළිතුරු සිතියමෙහි ලිවිය යුතු නොවේ.
- ❖ **ප්‍රශ්න අංකය** හා අදාළ **උප කොටස්වල අංක** පිළිතුරු පත්‍රයේ පැහැදිලිව සඳහන් කළ යුතුය.
- ❖ සිතියම ඔබේ පිළිතුරු පත්‍රයට **ඇමිණිය යුතු නොවේ.**

i. සිතියම්ගත ප්‍රදේශයේ A, B, C, හා D වලින් නිරූපණය කර ඇති භෞතික ලක්‍ෂණය නම් කරන්න. (ලකුණු 02 යි)

ii. සිතියමේ අංක 1, 2, 3, හා 4 වශයෙන් දක්වා ඇති සංස්කෘතික ලක්‍ෂණ නම් කරන්න. (ලකුණු 02 යි)

iii. අංක 01 චතුරස්‍රයේ සිතියම්ගත ප්‍රදේශය දෙගුණයකින් සංකෝචනය කරන්න. (ලකුණු 03 යි)

iv. සංකෝචනය කරන ලද සිතියමට රේඛීය පරිමාණය නිර්මාණය කරන්න. (ලකුණු 02 යි)

v. g - h මාර්ගයේ සැබෑ දුර ගණනය කරන්න. (ලකුණු 03 යි)

vi. සිතියම්ගත ප්‍රදේශයේ භූවිෂමතාවය හා ජලවහනය අතර අන්තර් සබඳතාවය කෙටියෙන් පහදන්න. (ලකුණු 04 යි)

vii. සිතියම්ගත ප්‍රදේශයේ ජනාවාස ව්‍යාප්තිය කෙරෙහි මානව සාධක බලපා ඇති ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 04 යි)

02. ඔබට සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි සම්මත සංකේත හා වර්ණ යොදා ගනිමින් පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.

I. ආරකන්යොමා කඳු වැටිය
II. තේම්ස් ගංගාව
III. ගෝබි කාන්තාරය
IV. වික්ටෝරියා විල
V. සොලමන් දූපත්
VI. මැගලන් සමුද්‍ර සන්ධිය
VII. ඔයාෂියෝ ප්‍රවාහය
VIII. සමකයෙන් ඡේදනයවන අප්‍රිකානු රටවල් අතරින් විශාලතම රට
IX. ලෝකයේ ගැඹුරුම සාගරික අගාධය
X. Covid 19 රෝගී තත්ත්වය ව්‍යාප්ත වීම ආරම්භ වූ නගරය

(ලකුණු 10 යි)

III කොටස

03. පහත වගු අංක 01 හි දැක්වෙන්නේ 2009 වර්ෂයේ ශ්‍රී ලංකාවේ තෝරාගත් දිස්ත්‍රික්ක කිහිපයක වාර්තා වූ ඩෙංගු රෝගීන් සංඛ්‍යාවයි. මෙම දත්ත භාවිතා කරමින් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

වගු අංක 01
ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක මට්ටමින් ඩෙංගු රෝගීන් සංඛ්‍යාව - 2009

දිස්ත්‍රික්කය	ඩෙංගු රෝගීන් සංඛ්‍යාව
කොළඹ	3292
ගම්පහ	3147
කළුතර	1270
මහනුවර	3448
මාතලේ	1373
නුවරඑළිය	212
ගාල්ල	467
හම්බන්තොට	767
මාතර	965
අම්පාර	207
ත්‍රිකුණාමලය	319
කුරුණෑගල	2391
පුත්තලම	525
අනුරාධපුරය	497
රත්නපුරය	1799

මූලාශ්‍රය - Ministry of Healthcare and Nutrition

i. වගු අංක 01 හි දත්ත සංඛ්‍යා ශ්‍රේණියක් මඟින් දක්වන්න. (ලකුණු 02 යි)

ii. ඔබ ඉහත I කොටසෙහි සකස් කළ දත්ත ශ්‍රේණිය භාවිතා කරමින් පන්ති ප්‍රාන්තර පහක් (5) සහිත සමූහිත සංඛ්‍යාත ව්‍යාප්තියක් නිර්මාණය කරන්න. (ලකුණු 05 යි)

iii. සංඛ්‍යාත ව්‍යාප්තියට අදාළ ජාල රේඛය සහ සංඛ්‍යාත බහුඅස්‍රය නිර්මාණය කරන්න. (ලකුණු 05 යි)

iv. ඔබගේ නිර්මාණය පදනම් කරගෙන ඩෙංගු රෝගයේ අවකාශීය ව්‍යාප්තියේ වෙනස්කම් තුනක් කෙටියෙන් පහදන්න. (ලකුණු 03 යි)

04.

i. ප්‍රායෝගික භූගෝල විද්‍යාවේ භාවිත ක්‍රමශිල්ප හතරක් නම් කරන්න. (ලකුණු 02 යි)

ii. තේමා සිතියම් විවිධ ක්‍රමශිල්ප ඔස්සේ ඉදිරිපත් කළ හැකිය. ඒ අනුව තේමා සිතියම් ඉදිරිපත් කළ හැකි ප්‍රධාන ක්‍රමශිල්ප දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

iii. ඔබ ඉහත ප්‍රශ්න අංක II හි නම් කළ එක් ක්‍රමශිල්පයක් තෝරාගෙන ඒ ආශ්‍රයෙන් තේමා සිතියමක් සකස් කරන ආකාරය උදාහරණයක් මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

iv. ඔබ තෝරාගත් ක්‍රමශිල්පයේ වාසි දෙකක් හා දුර්වලතාවයක් කෙටියෙන් සාකච්ඡා කන්න. (ලකුණු 05 යි)

05. පහත ප්‍රස්තාරය මගින් දැක්වෙන්නේ ලෝකයේ ඇස්තමේතුගත හා ප්‍රක්ෂේපිත නාගරික ජනගහනය වඩා සංවර්ධිත කලාප හා අඩු සංවර්ධිත කලාප වලට අදාළව 1950 - 2050 දක්වා තත්වයයි. මෙම ප්‍රස්තාරය ඇසුරුන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ලෝකයේ ඇස්තමේතුගත හා ප්‍රක්ෂේපිත නාගරික ජනගහනය
වඩා සංවර්ධිත හා අඩු සංවර්ධිත කලාප 1950 - 2050



මූලාශ්‍රය - world Bank Report 2018

i. මෙම ප්‍රස්තාරික ක්‍රමය නම් කරන්න. (ලකුණු 02 යි)

ii. ප්‍රස්තාරයෙන් දැක්වෙන ආකාරයට නාගරික ජනගහනයේ දක්නට ලැබෙන ලක්ෂණ තුනක් දක්වන්න. (ලකුණු 03 යි)

iii. මෙබඳු දත්ත දැක්වීමේ දී මෙම ප්‍රස්තාරික ක්‍රමය යොදා ගැනීමේ වාසි දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

iv. මෙම ප්‍රස්තාරික ක්‍රමය හැර මෙම දත්ත දැක්වීමට වෙනත් සුදුසු ප්‍රස්තාරික ක්‍රමයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

06.

i. භූගෝලීය තොරතුරු පද්ධතිය යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

ii. භූගෝලීය තොරතුරු පද්ධතිය ක්‍රමවත්ව පවත්වාගෙන යෑම සඳහා වැදගත් වන මූලිකාංග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

iii. නූතන සිතියම්කරනයේ දී භූගෝලීය තොරතුරු පද්ධති තාක්ෂණය භාවිතයේ ප්‍රයෝජන තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

iv. සීඝ්‍රයෙන් ව්‍යාප්තවන භූගෝලීය තොරතුරු පද්ධති තාක්ෂණය වර්තමානයේ බහුලවම භාවිතා කරන ක්ෂේත්‍ර තුනක් නම් කොට එම ක්ෂේත්‍රවල භූගෝලීය තොරතුරු පද්ධති තාක්ෂණය යොදාගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020 අගෝස්තු
Certificate of Education (Advanced Level) Examination, 2020 Agust
கல்விப் பொதுத்தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை 2020 ஓகஸ்ற்

22 I

භූගෝල විද්‍යාව I
புவியியல் I
Geography I



ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - UVA

SCALE 1 : 50 000

සමෝච්ඡ රේඛා අන්තරය මීටර 20
சமவுயரக்கோட்டு இடைவெளி 20 மீற்றர்
Contour Interval 20 metres

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය - 2020
General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2020

භූගෝල විද්‍යාව II
Geography II

22 S II

කාලය : පැය තුනයි
Time : Three hours

උපදෙස් :
❖ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්වත්** තෝරාගෙන, **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුරු සපයන්න.

I කොටස - භෞතික භූගෝල විද්‍යාව

01) (I) යමහලක් නිර්මාණය වන්නේ කෙසේද? (ලකුණු 02 යි)
(II) ආක්‍රාන්ත හා නිෂ්ක්‍රාන්ත භූ රූප දෙකක් නම් කර ඒවායේ නිර්මාණ ක්‍රියාවලිය රූප සටහන් ආධාරයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
(III) යමහල්කරණයේ හිතකර හා අහිතකර බලපෑම් 3 ක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
(IV) තැටි මායිම් ආශ්‍රිතව සිදු වන චලන ස්වාභාවයන් දෙකක් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

02) (I) භූ විද්‍යාත්මක හා දේශගුණ විද්‍යාත්මක උපද්‍රව දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)
(II) උපද්‍රව හා ආපදා අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
(III) ස්වාභාවික උපද්‍රවයක් තෝරාගෙන එය තීව්‍ර කිරීමට බලපාන මානව ක්‍රියාකාරකම් දෙකක් උදාහරණ සපයමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)
(IV) ඔබ ඉහත ප්‍රශ්න අංක (III) හි තෝරාගත් ස්වභාවික ආපදාවය අවම කර ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග තුනක් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

03) (I) බියෝමයක් යනු කුමක් දැයි නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)
(II) ලෝකයේ දක්නට ලැබෙන එක් ප්‍රධාන බියෝම වර්ගයක් තෝරාගෙන එහි ව්‍යාප්තිය කෙරෙහි බලපාන සාධක 3 ක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
(III) ඔබ තෝරාගත් බියෝමයේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් කෙටියෙන් විමසන්න. (ලකුණු 06 යි)
(IV) ශ්‍රී ලංකාවේ තෙත් බිම් බියෝමයේ ඇති පාරිසරික වැදගත්කම් 3 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

04) (I) පස හා පාෂාණ යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)
(II) පාංශු ජනන සාධක දෙකක් නම් කර ඉන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 06 යි)
(III) පාංශු පැතිකඩක වර්ධනය රූප සටහනක් මගින් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)
(IV) තෙත් කලාපයේ ප්‍රධාන පාංශු ගණය නම් කර ඔබ නම් කළ පාංශු ගණයේ ලක්ෂණ තුනක් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

05) (I) ජනාවාසයක දක්නට ලැබෙන මූලිකාංග හතරක් නම් කරන්න. (ලකුණු 02 යි)

(II) ජනාවාස වර්ධනයේ ධූරාවලියක් දක්නට ලැබේ. එම ධූරාවලියේ අවස්ථා තුනක් නම් කර ඒවා වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(III) ලෝකයේ ජනාවාසවල විවිධ රටා දක්නට ලැබේ. ඉන් සවිධි ජනාවාසවල රටා තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(IV) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනාවාස වර්ග තුනක් තෝරාගෙන ඒවායේ දක්නට ලැබෙන මූලික ලක්ෂණ සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

06) (I) නාගරිකරණය යනු කුමක් ද? (ලකුණු 02 යි)

(II) නාගරිකරණ ක්‍රියාවලිය කෙරෙහි බලපාන සාධක තුනක් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

වර්ෂ 2014 හා වර්ෂ 2030 වන විට කලාප අනුව ලෝක නාගරිකරණ ප්‍රතිශතය පහත වගුවේ දැක්වේ.

වගු අංක 1

කලාපය	නාගරික ප්‍රතිශතය	
	2014	2030
අප්‍රිකාව	40.0	47,1
ආසියාව	47.5	56.3
යුරෝපය	73.4	77.0
ලතින් ඇමරිකාව හා කැරිබියන් කලාපය	79.5	83.0
උතුරු ඇමරිකාව	81.5	84.2
ඕෂනියාව	70.8	71.3
ලෝකය	53.6	60.0

මූලාශ්‍රය - world Bank Report

(III) ඉහත වගුවේ දත්ත උපයෝගී කර ගනිමින් කලාප අනුව ලෝක නාගරිකරණ ප්‍රතිශතයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ තුනක් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(IV) සංවර්ධනය වෙමින් පවතින රටවල නාගරිකරණය හේතුවෙන් මතුව ඇති සමාජ ආර්ථික ගැටලු දෙකක් හා සෞඛ්‍ය ගැටලු එකක් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

07) (I) නිෂ්කර්ෂක කර්මාන්තයක් යනු කුමක් ද? (ලකුණු 02 යි)

(II) ආකර කැණීමේ ක්‍රම දෙකක් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(III) ලෝක ආකර කර්මාන්තය ආශ්‍රිතව දක්නට ලැබෙන ගැටලු තුනක් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(IV) ආකර කර්මාන්ත වල දක්නට ලැබෙන විශේෂ ප්‍රවණතා 3 ක් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

08) (I) පහත ලංකා සිතියමේ A සිට D දක්වා ඇති සංචාරක කලාප පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02 යි)

(II) දකුණු වෙරළ ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස වර්ධනය වීමට බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(III) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ පදනම කෙරෙහි බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(IV) සංචාරක කර්මාන්තය නගා සිටුවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

සිතියම 1



මූලාශ්‍රයය: ශ්‍රී ලංකා ජාතික සිතියම් සංග්‍රහය පාසල් මුද්‍රණය දෙවන සංස්කරණය 2015